සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

1වන අධියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல
1st 4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல / My No: DDD/HO/7/SD/06/ID/FD

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2016.05.06

සියළුම දිස්ත්‍රික් ලේකම්/අතිරේක දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**ජාත්‍යන්තර දුම්වැටි හා මත් විරෝධී දිනය - 2016**

දිළිඳුකම අවම වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීමේ උදාරතර පරමාර්ථයෙන් ආරම්භ කරන ලද සමෘද්ධි/දිවිනැගුම වැඩසටහන තුළින් මත්ද්‍රව්‍ය හා දුම්වැටි සඳහා ඇබ්බැහි වූ ප්‍රජාව එම පීඩාවෙන් නිදහස් කර ගැනිම සඳහා මේ වන විටත් සියළුම දිස්ත්‍රික්කයන් ආවරණය කරමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී. ඒ අතරින් ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව පැවැත්වෙන දුම්වැටි හා මත් විරෝධී කොඩි වැඩසටහන ඉතා ආකර්ශනීය වුත් ඵලදායී වුත් දීප ව්‍යාප්ත වැඩසටහනකි.

ගෝලීය දුම්වැටි වසංගතයෙන් වර්තමානයේ ලෝක ජනගහනයෙන් වසරකට මිලියන 06ක් මියැදෙන අතර එය 2030 වන විට වසරකට මිලියන 08ක් දක්වා වර්ධනය වන බවත් එයින් 80%ක් සංවර්ධනය වෙමින් පවතින රටවල ජනගහනය වන අතර අප රටේද අඩු ආදායම්ලාභී පවුල්වල ආදායමින් 35% ක් මද්‍යසාර හා දුම්වැටි සඳහා විනාශ කරන බව සමීක්ෂණ වලින් තහවුරු කර ඇත.

දිළිඳුකමට ප්‍රධාන හේතුවක් ලෙස මෙම ක්‍රියාකාරකම් හැදින්විය හැකි අතර මෙවැනි සංවර්ධන ප්‍රතිරෝධකයන්ට පිළියම් සෙවීමේ අරමුණින් ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව මත්ද්‍රව්‍ය හා දුම්වැටි විරෝධී කොඩි වැඩසටහන මෙවර දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇත.

2016 වර්ෂයේ දී "මතින් නිදහස් රටක්" ජාතික වැඩසටහන තුළ දිවිනැගුම දෙපාර්තමේන්තුවට පැවරී ඇති වගකීම් මුලික කර ගනිමින් වඩාත් ඵලදායී ලෙස අදාල සෑම කාර්යයක්ම ක්‍රියාවට නැංවිය යුතු වේ. සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිද්දෙන් පාසල් දරු දැරියන් සඳහා ද විශේෂ දැනුවත් කිරිමේ වැඩසටහන් සඳහා මුලික තත්ත්වයක් ලබා දෙමින් සෑම ජන කොටසක්

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / மேலதிக பணிப்பாளர்தலைமையதிபதி / Additional Director General | අධ්‍යක්ෂ (පාලන) / பணிப்பாளர் (நிர்வாகம்) / Director (Administration) | කාර්යාලය / அலுவலகம் / Office |
| --- | --- | --- | --- | --- |
| Tel- | 011-2873802/2872202 | 011-2871672 | 011-2873799 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2887280 | 011-2873996 | **011- 2887722**(Hotline) |
| E-mail- | dg@divineguma.gov.lk | adg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | |

සඳහාම මත් හා දුම්වැටි භාවිතයේ ඇති අනර්ථය සමාජ විනාශය පිළිබඳදැනුවත් කළ යුතු අතර මෙම දැනුවත් කිරිම් වඩාත් නිර්මාණශීලිව පුද්ගල මනසට සංවේදී අයුරින් සන්නිවේදනය කිරිමට සැලසුම් කළ යුතු වේ.

## 02. පරමාර්ථ

- ❖ දුම්වැටි භාවිතයෙන් ජනතාව නිදහස් කර ගැනිම ප්‍රධාන පරමාර්ථය කොට ගෙන "මතින් නිදහස් රටක්" ජාතික වැඩසටහනේ ක්‍රියාකාරි වැඩ පිළිවෙලට අනුව ක්‍රියාත්මක වීම.
- ❖ දිලිදුකමට බලපා ඇති ප්‍රධානතම සාධකය වන දුම්වැටි මද්‍යසාර, මත්ද්‍රව්‍ය භාවිතයෙන් පුද්ගලයන්, පවුල් නිදහස් කර ගැනීම සඳහා ළමා, තරුණ, කාන්තා සංවිධාන බලගන්වමින් වැඩසටහන් ක්‍රියාක්මක කිරිම.
- ❖ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හරහා පිටරට ඇදී යන අපේ රටේ මුදල් ආරක්ෂා කිරීම.
- ❖ රටේ ප්‍රධාන සංවර්ධන ප්‍රතිරෝධකයක් වන මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට ප්‍රධාන ස්ථානයක්ලබා දෙමින් ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරිම හා මත්ද්‍රව්‍ය භාවිතය නිසා බිඳ වැටුණ පවුල් නඟා සිටුවීමට ක්‍රියාත්මක වීම.
- ❖ දුම්පානය නිසා විවිධ පීඩනයන්ට පත්වන ජනතාව දැනුවත් කර එයින් මුදවා ගැනීමට කටයුතු කිරිම.
- ❖ මත්ද්‍රව්‍ය භාවිතා කරන පුද්ගලයන් ඇති පවුල් මත්ද්‍රව්‍ය භාවිතයෙන් නිදහස් විය යුතු බවට කොන්දේසි ඉදිරිපත් කරමින් ඒ සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරිම.

## 03. වැඩසටහන ක්‍රියාත්මක කිරිම.

**03.1**. මෙවර තේමාව **"සිගරට් දුමෙන් නිදහස් සැමට ජීවත්වීමට හිතකාමී පරිසරයක්"** වන අතර, කොඩි වැඩසටහනෙහි අපේක්ෂිත ආදායම් ඉලක්කය රුපියල් මිලියන 250ක් වේ.

**03.2**. 2016 වසරේ කොඩි වැඩසටහන පැවැත්වීමට අපේක්ෂිත කාලය වනුයේ මැයි 31 දින සිට ජුනි 12 දින දක්වා වේ. සෞඛ්‍ය වියදමින් 22% කට වඩා සෘජුවම මද්‍යසාර හා දුම්වැටි භාවිතා කර රෝගී වුවන් වෙනුවෙන් වැය කරන බැවින් සෞඛ්‍යයට වන හානිය ඒ මඟින් ආර්ථිකයට වන අහිතකර බලපෑම පිළිබඳව ජනතාව දැනුවත් කළ යුතු වේ. මේ වසරේ අපේක්ෂිත ඉලක්කය ඉක්මවා යෑමට හැකි වන අයුරින් තේමාවට අනුගත වු වැඩසටහන් සංවිධානය කළ යුතු වේ. දුම්පානය නිසා පරිසරයේ වන විනාශය දරුවෙකු මව්කුස තුළ ජීවත් වන අවධියේ පටන් ඉන් ඔබ්බට බලපාන අයුරු වඩාත් සංවේදී වන ලෙසින් දැනුවත් කිරිම සුදුසුය. එලෙස සංවිධානය කරනු ලබන වැඩසටහන් පිළිබඳ තොරතුරු ඇතුලත් දිස්ත්‍රික් වාර්තාව 2016 මැයි 25 දිනට පෙර සමාජ සංවර්ධන අංශය වෙත එවිය යුතුය.

**03.3.**කොඩි හා ස්ටිකර් සඳහා මුදලක් සඳහන් කර නොමැති බැවින් අරමුදල් රැස් කිරීමේ දී ස්වේච්ඡා ජන සහභාගීත්වයෙන් සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ. මෙම වැඩසටහන් සඳහා දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ පූර්ණ සහයෝගය ලබා ගත හැකි අතර ඔවුන්ගේ අකමැත්තෙන් මුදල් ලබා ගැනීම කිසිම විටක නොකළ යුතු වේ. එබඳු සිද්ධීන් වාර්තා වුවහොත් අදාල නිලධාරීන්ට එරෙහිව විනය කටයුතු කිරීමට සිදු වනු ඇත.

**03.4.**දිස්ත්‍රික් මට්ටමින් ලබා දී ඇති ඇණවුම් අනුව මුද්‍රණය කරන ලද කොඩි, කැටලේබල් ආදීය 2016.05. 25 දිනට පෙර දිවිනැගුම දිස්ත්‍රික් කාර්යාල වෙත ලබාදීමට නියමිතය. ඇණවුම් කර ඇති කොඩි හා ස්ටිකර් අනිවාර්යෙන් අලෙවි කළ යුතු අතර, පිළිගත හැකි සාධාරණ හේතුවක් මත කොඩි /ස්ටිකර් ප්‍රමාණයක් ඉතිරි වී තිබේ නම්, ඒ පිළිබඳව සැකසූ දිස්ත්‍රික් වාර්තාව සති දෙකක් තුළ සමාජ සංවර්ධන අංශය වෙත එවිය යුතුය.

**03.5.**2016 මැයි 31 දින පෙ.ව.8.00 ට කොඩි අලෙවිය ආරම්භ කර ජූනි 12 දින ප.ව.5.00ට අවසන් කළ යුතු වේ. 2016.06 13 දින ප්‍රජාමූල බැංකු කලමණාකරු /ප්‍රජාමූල සමිති අධ්‍යක්ෂ ඉදිරියේ කැට විවෘත කළ යුතු වේ.

**03.6.**කොඩි අරමුදල් එකතු කිරීම සඳහා වසම්භාර නිලධාරීන් භාවිතා කරනු ලබන කැට ප්‍රජා මූල බැංකු කලමණාකරු විසින් පරීක්ෂා කොට තම අත්සන යොදා මුද්‍රා තැබිය යුතු වේ. 2016.06.13 දින කැට විවෘත කිරීමට ප්‍රථම ප්‍රජාමූල බැංකු කලමණාකරු විසින් තම අත්සන හා මුද්‍රා තැබීම පරීක්ෂා කළ යුතු වේ. අදාල කැට වල ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම ප්‍රජාමූල බැංකු කලමණාකරුවන්ට පැවරෙන අතර අමතර පරිත්‍යාග වශයෙන් ලැබෙන ආධාර වෙනම ලේඛණයක සටහන් කළ යුතු වේ.

**03.7**. අනිවාර්යෙන් පිහිට විය යුතු සමාජ කොටස්වලට සෘජුවම ප්‍රතිලාභ ලබා දිය හැකි මෙම වැඩසටහන තවදුරටත් සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුළින් දිවිනැගුම වැඩසටහන සම්බන්ධයෙන් පුළුල් පිළිගැනීමක් හා ප්‍රසාදයක් වර්ධනය කර ගැනීමට හැකි වන අයුරින් වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාවට නැංවිය යුතුය. පූර්ණ ප්‍රජා දායකත්වයෙන් එකතු කරන ලද අරමුදල් සමාජ සංවර්ධන පදනම්හි රඳවා ගන්නා බැවින් ඔබ බල ප්‍රදේශයේ සියළුම ආගමික නායකයින්, ප්‍රභූවරුන්, ස්වේච්ඡා සංවිධාන සාමාජිකයින්, පාසැල් සිසුන්, ළමා සමාජ දරුවන් හා දේශපාලන නායකයින් ඇතුළු සියළුම ජන කොටස්වල සහයෝගය ලබා ගෙන වැඩසටහන උපරිම සාර්ථකත්වයක් කරා මෙහෙයවීමට අවශ්‍ය උපදෙස් ලබා දිය යුතුය.

**03.8.**මෙවර කොඩි මුද්‍රණය කිරීම සඳහා සමාජ සංවර්ධන ජාතික පදනමේ අරමුදල් ප්‍රයෝජනයට ගන්නා අතර, ඉදිරියේ දී එවැනි කටයුතු සඳහා දායකත්වය ලබා ගැනීමට ජාතික / දිස්ත්‍රික් සමාජ සංවර්ධන පදනම් ශක්තිමත් කළ යුතුය. එබැවින් සෑම ප්‍රාදේශීය සමාජ සංවර්ධන පදනමකින්ම 2016 කොඩි අලෙවි ආදායමින් 6% ක මුදලක් ලබා දිය යුතු අතර, ඉන් 4%ක් ජාතික සමාජ සංවර්ධන

පදනමටද 2%ක් දිස්ත්‍රික් පදනමට ද ලබා දිය යුතුය. අදාල මුදල් අගෝස්තු මස 01 දිනට පෙර දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබා දිය යුතු අතර, අගෝස්තු 10 දිනට පෙර දිස්ත්‍රික් කාර්යාලය මඟින් ජාතික පදනම වෙත ( සමාජ සංවර්ධන අංශය) වෙත ලබාදීමට කටයුතු කළ යුතුය. **"ජාතික සමාජ සංවර්ධන පදනම"** නමින් ලියන ලද චෙක්පත් සමාජ සංවර්ධන අංශය වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.

## 04. මූලික වාර්තාව කිරීම.

2016.06.13 දින ප්‍රජා මූල බැංකු කළමණාකරු විසින් බාර ගන්නා අරමුදල් 2016.06.14 දින ප්‍රාදේශීය ලේකම්/ මූලස්ථාන කළමණාකරු/ දිවිනැගුම ප්‍රජාමූල සමිති අධ්‍යක්ෂ වෙත බාර දිය යුතුය. එසේ ප්‍රජා මූල බැංකු කළමණාකරුගෙන් බාර ගන්නා කොඩි ආදායමෙහි ප්‍රාදේශීය වාර්තාව 2016.06.17 දින දිස්ත්‍රික් කාර්යාලය වෙත බාර දිය යුතුය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලැබෙන ආදායම් පදනම් කර ගත් දිස්ත්‍රික් වාර්තාව පමණක් **2016.06.20 දිනට පෙර ඇමුණුම් අංක 05 භාවිතා කර දිවිනැගුම ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන අංශය වෙත ලබා දිය යුතුය. වාර්තා කඩිනමින් ලබා දීමට socialdev@divineguma.gov.lk යන විද්‍යුත් තැපැල භාවිතා කළ හැකිය.**

## 05. ඇගයීම් ක්‍රමවේදය හා ඊට අදාල වාර්තා එවීම.

දිස්ත්‍රික් හා ජාතික ඇගයීම් සඳහා නිලධාරින් තෝරා ගැනිම වඩාත් නිවැරිදි ලෙස ගණනය කළ යුතු නිසාත් ජාතික ඇගයීම ඉතා ප්‍රශස්ත මට්ටමින් සිදු කිරිමට අපේක්ෂිත බැවින් 2015 සිට කලින් පැවැති ක්‍රමවේදය සංශෝධනය කර ඇත.

### 05.1. දිස්ත්‍රික් ඇගයීම

පහත සඳහන් ඇගයීම්ලාභීන් තෝරා ගැනිම සඳහා අදාල වු නිර්නායකයන් පහත වගුවේ දක්වා ඇත. සමස්ථ දිස්ත්‍රික් ඇගයීම පොදු ක්‍රමවේදයක් තුළ සිදු කළ යුතුය.මෙහි දී දිස්ත්‍රික්කය තුළ වැඩිම කොඩි ආදායම පාදක කොට ගනිමින් (දී ඇති නිර්නායකවලට අනුකූලව ගණනය කිරීමෙන්) පහත සඳහන් නිලධාරින් ගෙන් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන තෝරා ගත යුතුය. එම ගණනය කිරිම් සඳහා මේ සමඟ 1 – 4A දක්වා ඇති ඇමුණුම් උපයෝගි කර ගත යුතු වේ. ( නිදසුන් ද දක්වා ඇත.) මූල්‍ය අක්‍රමිකතා සිදුවන අයුරින් කිසිදු නිලධාරි ඇගයීමක් නොකළ යුතුය.

- වැඩිම ආදායම් ඉපයු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය
- වැඩිම ආදායම් ඉපයු මූලස්ථාන කළමණාකරු
- වැඩිම ආදායම් ඉපයු දිවිනැගුම ප්‍රජාමූල සමිති අධ්‍යක්ෂ
- වැඩිම ආදායම් ඉපයු සමාජ සංවර්ධන සහකාර

  (මේ ඇගයීම්ලාභීන් තේරීම ඉපයු ප්‍රා.ලේ.කො. තොරතුරු මත)
- වැඩිම ආදායම් ඉපයු ප්‍රජා මූල බැංකු කළමණාකරු

- වැඩිම ආදායම් ඉපයූ  දිවිනැගුම සංවර්ධන නිලධාරි
- වැඩිම ආදායම් ඉපයූ ගම්මාන සමිතිය

**<u>සැලකිය යුතුයි.</u>**

**<u>ජාතික මට්ටමේ ජයග්‍රාහකයින් තෝරා ගැනීම සඳහා, දිස්ත්‍රික් ප්‍රමුඛතාවය අනුව  සෑම කාණ්ඩයකින්ම 5 දෙනෙකු බැගින් තෝරා එවිය යුතුය.</u>**

| ඇගයීම්ලාභීන් | ආදායම | තෝරා ගැනීමට පදනම් කර ගත් දත්තයන් | ලකුණු |
|---|---|---|---|
| **වැඩිම ආදායම් ඉපයූ දිස්ත්‍රික්කය ( ජාතික මට්ටමේ ඇගයීම)** | **දිස්ත්‍රික්කය උපයා ගත් මුළු ආදායම රු.** | දිස්ත්‍රික් ජනගහනය | ලකුණු 30 |
| | | දිස්ත්‍රික්කයට අයත් කලාප සංඛ්‍යාව | ලකුණු 20 |
| | | දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව | ලකුණු 20 |
| | | දිස්ත්‍රික්කයේ සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරින් සංඛ්‍යාව | ලකුණු 30 |
| **වැඩිම ආදායම් ඉපයූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය (දිස්ත්‍රික් මට්ටමේ ඇගයීම)** | **ප්‍රා. ලේ.කො.උපයා ගත් මුළු ආදායම රු.** | ප්‍රා.ලේ.කොට්ඨාසයට අයත් ජනගහනය | ලකුණු 30 |
| | | ප්‍රා.ලේ.කොට්ඨාසයට අයත් කලාප සංඛ්‍යාව | ලකුණු 20 |
| | | ප්‍රා.ලේ.කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව | ලකුණු 20 |
| | | ප්‍රා.ලේ.කොට්ඨාසයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරින් සංඛ්‍යාව | ලකුණු 30 |
| **වැඩිම ආදායම් ඉපයූ කලාප කලමණාකරු** | **කලාපය තුළ උපයා ගත් ආදායම රු.** | කලාපයේ ජනගහනය | ලකුණු 50 |
| | | කලාපය තුළ සේවයේ නියුතු ක්ෂේත්‍ර නිලධාරින් සංඛ්‍යාව | ලකුණු 50 |
| **වැඩිම ආදායම් ඉපයූ සංවර්ධන නිලධාරි තේරීම** | **වසම තුළ උපයා ගත් ආදායම රු.** | වසමේ ජනගහනය | ලකුණු 100 |
| **වැඩිම ආදායම් ඉපයූ ගම්මාන සමිතිය තේරීම** | **ගම්මානය තුළ උපයා ගත් ආදායම රු.** | ගම්මානයේ ජනගහනය | ලකුණු 100 |

ඇඟයීම්ලාභීන් තෝරා ගැනීමේ දී 2016.06.12 දිනෙන් අවසන් වන කොඩි වැඩසටහනෙන් වාර්තා කර ගන්නා අදායම පමණක් ඇගයීම සඳහා අදාල වේ. අදාල ඇමුණුම් වලට අනුව දිස්ත්‍රික්කයෙන් තොරතුරු ලබා දිය යුතු වේ. ඇමුණුම් අංක 1 සිට 4A දක්වා තොරතුරු සති 03ක් ඇතුළත ද අංක 05 මූලික තොරතුරු ලබා ගන්නා ඇමුණුම කොඩි අලෙවියෙන් පසු සතියක් ඇතුලත ප්‍රධාන කාර්යලයේ සමාජ සංවර්ධන අංශය වෙත එවිය යුතුය.

## 06. ජාතික උපහාර උළෙල

පසුගිය වර්ෂවල නිලධාරි ඇගයීම් උළෙල 2016 වර්ෂයේ ඇගයීමත් සමඟ අගෝස්තු මස පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත. ඒ සම්බන්ධයෙන් ඉදිරියේ දී ඔබ දැනුවත් කරනු ලැබේ.

මෙම කොඩි වැඩසටහන සාර්ථක කිරිමට ඔබ ඇතුළු කාර්යය මණ්ඩලය දක්වන සහයෝගය ඉතා කෘතවේදීව අගය කරමි.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සමාජ සුභ සාධන අමාත්‍යාංශය - කා .දැ.ගැ.ස.

02. සමාජ සවිබලගැන්වීම් හා සුභ සාධන ගරු අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්- කා.දැ.ගැ.ස.

03. සමාජ සවිබලගැන්වීම් හාසුභ සාධන ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් - කා.දැ.ගැ.ස.

04. ප්‍රධාන ගණකාධිකාරි, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස. හා අ.ක.ස

05.ප්‍රධාන අභ්‍යන්තර විගණක , දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව- කා. දැ.ගැ.ස. හා අ.ක.ස.

06. සියළුම අංශ ප්‍රධානීන් - කා.දැ.ගැ.ස.